**කොවිඩ්-19 සති පාසල**

**2021 - හයවන සතිය**

**10 ශ්‍රේණිය** **භූගෝල විද්‍යාව**

## 2 පාඩම - පෘථිවියේ ප්‍රධාන භෞතික ලක්ෂණ

**දේශගුණ වර්ග ව්‍යාප්තිය හා මූලික ලක්ෂණ**


* දීර්ඝ කාලයක් තුළ පවත්නා වායුගෝලීය සාමාන්‍ය තත්ත්වය දේශගුණය නම් වේ.

* දේශගුණික වර්ගයක් තීරණය කිරීම සඳහා එම ප්‍රදේශයේ පවතින උෂ්ණත්වය, වර්ෂාපතනය, වර්ෂාපතණය ලැබෙන ක්‍රම, වර්ෂාපතනය ලැබෙන කාල සීමාව වැනි සාධක පදනම් වේ.

* ලෝකයේ දේශගුණ වර්ග පිළිබඳ මුල්ම අදහසක් ඉදිරිපත් කරන ලද්දේ ක්‍රි. පූ. 384 දී පමණ ග්‍රීක ජාතික ඇරිස්ටෝටල් විසිනි.

* පසු කාලීනව ඔස්ටින් මිලර්, තෝන්ත්වේට්, කෙපන් යන අයද ලෝක මට්ටමින් පුළුල් දේශගුණ වර්ගීකරණ ඉදිරිපත් කර ඇත.

* ලෝකයේ අක්ෂාංශ පදනම් කරගෙන ප්‍රධාන දේශගුණ කලාප තුනක් හඳුනාගෙන ඇති අතර මෙය ග්‍රීක දේශගුණ වර්ගීකරණය ලෙස සලකයි.



ක්‍රියාකාරකම.

1. ලෝකයේ දේශගුණ වර්ගීකරණයන් ඉදිරිපත් කළ පුද්ගලයන් දෙදෙනෙක් නම් කරන්න.

2. දේශගුණික වර්ගයක් තීරණය කිරීම කෙරෙහි බලපාන්නා වූ සාධක හතරක් ලියන්න.

3. ලෝකයේ ප්‍රධාන දේශගුණික කලාපයන්හි පැතිරීම රූප සටහනක් මගින් පැහැදිලි කරන්න.

4. ලෝකයේ අක්ෂාංශ පදනම් කරගත් ප්‍රධාන දේශගුණ කලාප තුන ලෝක ආකෘති සිතියමක සේයා කර දක්වන්න.

5. කිසියම් ප්‍රදේශයක දේශගුණය මානුෂ කටයුතු කෙරෙහි බලපාන ආකාරය නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

6. ලෝකයේ ප්‍රධාන දේශගුණික කලාපයන් ඇසුරින් පහත වගුව සම්පූර්ණ කරන්න.

| | නිවර්තන දේශගුණය | සෞම්‍ය දේශගුණය | ශීත දේශගුණය |
|---|---|---|---|
| පිහිටීම | | | |
| වාර්ෂික වර්ෂාපතනය හා උෂ්ණත්වය | | | |
| ප්‍රධාන ලක්ෂණ | | | |
| විශේෂිත දේශගුණ වර්ගයන් | | | |